# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2397/22 - 2024 අගෝස්තු මස 13 වැනි අඟහරුවාදා - 2024.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 05/2024 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු නිවේදන අංක 666 හි දැක්වෙන කොන්දේසි සංශෝධනය**

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නිවේදනය මගින් 2018 ජනවාරි මස 18 දිනැති අංක 2054/42 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 04/2018 දරන සුරාබදු නිවේදනයෙන් සංශෝධිත 1979 දෙසැම්බර් මස 31 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 666 දරන සුරාබදු නිවේදනයෙහි උපලේඛනය 2024 අගෝස්තු 14 දින සිට පහත පරිදි සංශෝධනය කෙරේ.

(1) 5 වැනි ඡේදයේ (V) උපඡේදය වෙනුවට පහත උපඡේදය ආදේශ කිරීම;

"(V) වයස අවුරුදු දහඅටට අඩු ඕනෑම පුද්ගලයින්.", සහ

(2) 11 වැනි ඡේදයේ (ඇ) උප ඡේදය අවලංගු කිරීම.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 08 - 0349



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*